# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2088/35 - 2018 සැප්තැම්බර් මස 12 වැනි බදාදා - 2018.09.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට කෑගල්ල ජල සම්පාදන ක්‍රමයේ ජල ගබඩා ටැංකිය හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක අයිතිය අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 07 වැනි දින,
අංක 35, ''ලක්දිය මැදුර''
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1415.

#### උපලේඛනය

කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 53 D, දික්ඇල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දික්ඇල්ල ජනපදය (බෙරගල) ගමේ පිහිටි - දික්ඇල්ලවත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 08 ක් පමණවන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | ප්‍රධාන මාර්ගයේ සිට නිවාසවලට ප්‍රවේශ මාර්ගය හා එම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | එම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | එම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | එම ඉඩමේ ඉතිරි කොටස හා මාර්ගය. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* :- එම්. පී. සිරිසේන,
අංක 85,
දික්ඇල්ල,
කෑගල්ල.

09 - 734


1A - G 28507 — 18 (2018/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*